*සැ. යු.* - 2017.01.06 වැනි දින පළ වූ අංක 2001 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,002 - 2017 ජනවාරි මස 13 වැනි සිකුරාදා - 2017.01.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 50 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 51 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 54 |

*සැ. යු.* - යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 දෙසැම්බර් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 පෙබරවාරි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජනවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ටෙන්ඩර් දැන්වීමයි

බද්දේගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත සඳහන් මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

| අනු. අංකය | බද්දේගම දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංකය | වාහනයේ ලියාපදිංචි අංකය | ආපසු ගෙවන ඇප මුදල රු. |
|---|---|---|---|
| 01. | 76668 | SP PU 7527<br>මහේන්ද්‍ර මැක්සිමෝ වර්ගයේ කුඩා ලොරි රථය | 2,000 |
| 02. | 85383 | SP WT 5293<br>බජාජ් පල්සර් වර්ගයේ යතුරුපැදිය | 2,000 |
| 03. | 49966 | අංක රහිත බජාජ් CT 100 වර්ගයේ යතුරු පැදිය | 1,000 |

| අනු. අංකය | ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංකය | වාහනයේ ලියාපදිංචි අංකය | ආපසු ගෙවන ඇප මුදල රු. |
|---|---|---|---|
| 04. | 72270 | 68-6537 කැන්ටර් රථය | 5,000 |
| 05. | 15599 | 47-8390 ටිපර් රථය | 2,000 |
| 06. | 57592 | QJ 9018 ත්‍රීවිල් (බජාජ්) රථය | 2,000 |

ඉහත උපලේඛනයට අදල ටෙන්ඩර් අයදුම්පත් 2017.02.01 වැනි දින සිට 2017.02.16 වැනි දින ප. ව. 12.00 දක්වා ගාල්ල මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා නිකුත් කරනු ලබන අතර, එක් අයදුම්පතක මිල රු. 100 කි. එක් වාහනයක් වෙනුවෙන් එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම් පත්‍රයක් පමණි.

02. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග නැවත ගෙවනු ලබන ඇප තැන්පත් රිසිට් පතේ ඡායා පිටපතක් ද, අමුනා තිබිය යුතු අතර, එය බහා එවනු ලබන ලිපි කවරයේ ඉහල වම් කෙළවරේ, ''මෝටර් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් අයදුම්පත්'' යනුවෙන් සඳහන් කර 2017.02.16 දින ප. ව. 3.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට භාරදිය යුතු ය.

03. අදල වාහනය පරීක්ෂා කර බැලීම සඳහා බද්දේගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ ඇල්පිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හමුවී අයදුම්පත්‍රය පෙන්වා දිනය සහ වේලාව ලබාගත යුතු ය.

04. එකී සියලුම ටෙන්ඩර් පත්‍ර 2017.02.17 දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණයේ දී විවෘත කරනු ලබන අතර, එදිනට එකී වේලාවට ටෙන්ඩර් අයදුම්කරුවන්ට හෝ බලය පවරනු ලබන නියෝජිතයකුට ඒ අවස්ථාවට සහභාගි විය හැකි ය. ඉන් පසුව ජයග්‍රාහි ටෙන්ඩර්කරු ටෙන්ඩර් මණ්ඩලය විසින් තෝරා ගනු ලබයි.

05. වැඩිම මිල ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්කරු එකී දින සිට සති දෙකක් (02) තුළ අදල අධිකරණය වෙත මුළු මුදල ම මුදලින් ගෙවා වාහනය අධිකරණයෙන් ඉවත්කර ගෙන යා යුතු අතර, එසේ නොහැකි වන ඉල්ලුම්කරුවන්ගේ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල රාජසන්තක කරනු ලැබේ.

06. යම්කිසි හේතුවකින් ඉල්ලුම්කරු ඉවත් වන්නේ නම් ඊළඟ ඉල්ලුම්කරුගේ මිල ගණන් සළකා බලනු ලබන අතර, අවසාන තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.

එම්. අයි. සෙනෙවිරත්න,
දකුණු පළාත්බද මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
ගාල්ල.

01-221

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

සමාගමේ නම : ඩෙල්කා එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 77443
ලියාපදිංචි කළ දිනය : 2011.02.25
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 4, තෙවන මහල, වීවර්ස් සාප්පු සංකීර්ණය, කුරුණෑගල.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී ටී එල් මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.
011-5922126

01-225

---

## සංකාරා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2016 දෙසැම්බර් මස 02 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පීවී 118475 යටතේ සංකාරා ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කර්යාලයීය ලිපිනය කොළඹ 05, වජිර පාර, අංක 68/3 හි බව අපි මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

කන්දයියා නීලකන්ඩන්,
සභාපති.

එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ සමාගම් ලේකම්වරු),
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

01-226

---

## ක්‍රෙසන්ට් සී රිසෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව මහජනතාවට කෙරෙන දැනුම්දීමයි.

2016 දෙසැම්බර් මස 16 වැනි දින සමාගම් ලියාපදිංචි අංක පී වී 118755 යටතේ ක්‍රෙසන්ට් සී රිසෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය යටතේ නව සමාගමක් සංස්ථාගත කරනු ලැබ ඇති බව සහ නව සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය කොළඹ 03, ඩීල් පෙදෙස, අංක 2, එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල, (5 වන තලය) හි, බව අප මෙයින් මහජනතාවට දැනුම් දෙමු.

මයුරන් තුරෙයිරාජා,
අධ්‍යක්ෂක,
සභාපති.

01-227

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 19/3 මුහන්දිරම් පාර මඩකලපුව දැනට අංකය 123, OXLEY AVENUE, WOODY POINT Q. L. D. 4019 AUSTRALIA යන ලිපිනයේ පදිංචි දිනේෂ් හන්ස්රාජ් සුබභාදේවි වන මම Q. L. D LAW GROUP - A NEW DIRECTION LOGAN CITY, P. O BOX 512 SPRING WOOD Q L D 4127, DX 40306 විසින් 2007.11.20 වැනි දින සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංකය 19/3 මුහන්දිරම් පාර මඩකලපුව යන ලිපිනයට අයත් ශාන්තජීවා සෞන්දරී මුරුගප්පන් (ජාතික හැඳුනුම්පත් අංකය 347751596 V) යන අයට මගේ සැබෑ හා සත්‍යවූ ඇටෝර්නි බලධාරිනි ලෙස මගේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා මෙයින් බලය පවරා දී තිබුණි. මෙම ඇටෝර්නි බලපත්‍රය නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්ත- මේන්තුවේ 2007.12.07 වැනි දින රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ 15 වැනි ලේඛනයේ 61 වැනි පිටුවේ අනු අංක 249 යටතේ ලියාපදිංචි කර ඇත. ඉහත සඳහන් කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට අහෝසි කර ඇති බව මා විසින් මහජනතාවට සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට ද මෙයින් දැනුම් දී සිටිමි. ඉහත නම සඳහන් කරන ලද ඇටෝර්නි බලධාරියා වන ශාන්තජීවා සෞන්දරී මුරුගප්පන් යන අය විසින් මෙහි පහත සඳහන් දිනයේදී කරනු ලැබූ ගනුදෙනු සහ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් මගේ කිසිදු වගකීමක් හා බැඳීමක් නැති බවට මෙයින් ප්‍රකාශ කොට සහතික කරමි.

දිනේෂ් හන්ස්රාජ් සුබභාදේවි.

01-229

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : රත්න ජෙම් ඇන්ඩ් ජුවෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 114273
ලියාපදිංචි කළ දිනය : 2016.06.21
කාර්යාල ලිපිනය : අංක 8, සුපර් මාකට් බිල්ඩිං, ඇහැලියගොඩ.

එල්. එම්. මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

01-272

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගම් නාමය : මාරුති මයික්‍රෝක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 117726
සංස්ථාගත කළ දිනය : 2016.11.23
ලියාපදිංචි කාර්යාලය : 76/බී 2/ටී 50, ඥාණවිමල පාර, දෙමටගොඩ, කොළඹ 09.

01-275

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව දැනුම්දීමයි

දෙහිවල, අත්තිඩිය ප්‍රධාන පාර, අංක 74 දරන ස්ථානයේ පදිංචි ජා. හැ. අංක 630104955 වී දරන අලංකාරගේ දීරසිංහ වන මම බොරලැස්ගමුව, අබේරත්න මාවත, අංක 136 සී දරන ස්ථානයේ පදිංචි ඩෙන්සිල් අල්විස් කොතලාවල යන අයට අධිකාරී ජේ. එම්. සිරිසෝම නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කළ වර්ෂ 2015.04.24 වැනි දින ලියා සහතික කළ අංක 4384 දරන ඇටර්නි බලපත්‍රයෙන් පවරා ඇති ඇටෝර්නි බලපත්‍රය මගින් මා නමින් සහ මා වෙනුවෙන් දී තිබූ ඇටෝර්නි බලය 2016.12.19 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසුව ඔහු විසින් හෝ එකී ඇටෝර්නි බලකාරයන් එක් අයෙක් හෝ වැඩි දෙනෙක් හෝ කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

අලංකාරගේ දීරසිංහ.

01-303

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම

සෞදි අරාබි රාජ්‍යයේ, රියාද් 11321, තැ. පෙ. 231000, කිංඩම් සෙන්ටර් ෆෝ සීසන්ස් හෝටලයෙහි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 711921770 වී සහ ගමන්බලපත්‍ර අංක එන් 4127298 දරන) තුවාන් හුසේම් අමීත් වන මා විසින් මහනුවර, තැන්නකුඹුර අංක 105/1 හි පදිංචි (ජා. හැ. අ. 808222167 වී දරන) මාගේ භාර්යාව වන සිත්ති ෆරියා අමීත් මාගේ ඇටෝර්නි බලකරු ලෙස නම් කරමින් සහ පත් කරමින් රියාද්හි සිටින ශ්‍රී ලංකා මහ කොමසාරිස් ඩබ්. ඒ. පී. සිරිමාන්න මහතා විසින් සහතික කරන ලදුව සිදු කරන ලද 2014 පෙබරවාරි මස 11 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බවත් මෙතැන් සිට එකී ඇටෝර්නි බලපත්‍රය ශූන්‍ය සහ බලරහිත වන බවත්, එයට නීතිය හමුවේ කිසිදු වලංගුතාවයක් නොමැති බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

තුවාන් හුසේම් අමීත්,

2016 දෙසැම්බර් මස 07 වැනි දින.

01-304

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ

සමාගමේ නම : හයාෂි ප්ලාන්ටේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 116133
සංස්ථාගත කළ දිනය : 2016.08.31
ලියාපදිංචි ලිපිනය : අංක 75, වෝඩ් පෙදෙස, කොළඹ 07.

01-306

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩී එස් එම් කෝපරේට් සර්විසස් (පී වී ටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 108498
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 80ඒ, සහන, මාවෙල්ල, ඉමදූව
ලියාපදිංචි දිනය : 2015.09.18

සමාගමේ නම : ලයන් ගේට් එන්ටර්ටේන්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 118080
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 151 බී, බක්මීගහ පාර, පෝරේ, අතුරුගිරිය
ලියාපදිංචි දිනය : 2016.11.17

සමාගමේ නම : මේනක ටී ෆැක්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 115600
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : කොම්බල, ඉමදූව, ගාල්ල
ලියාපදිංචි දිනය : 2016.08.08

සමාගමේ නම : නර්ස් ඔන් කෝල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 114456
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 25/9, ශ්‍රී දේවානන්ද පාර, තුම්බෝවිල, පිළියන්දල
ලියාපදිංචි දිනය : 2016.06.17

සමාගමේ නම : ආර් පී ෆැසිලිටි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 114443
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 25/9, ශ්‍රී දේවානන්ද පාර, තුම්බෝවිල, පිළියන්දල.
ලියාපදිංචි දිනය : 2016.06.17

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

01-307

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ක්ලෝවර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 115846
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 44, වියලිවෙල, ජම්බුගස්පිටිය, මහනුවර
ලියාපදිංචි දිනය : 2016.08.18

සමාගමේ නම : යමු ලංකා ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 118289
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 280/6, ධර්මාශෝක මාවත, කහන්තොට පාර, මාලඹේ
ලියාපදිංචි දිනය : 2016.11.24

සමාගමේ නම : ඔල්යා එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 113452
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : කුසුම් සෙවණ, උඩුපිල, මිරිස්ස
ලියාපදිංචි දිනය : 2016.05.05

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරුන්.

01-308

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : පූජා ප්‍රොඩක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 118529
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 27 ඒ, ෆෙයාර් මවුන්ට් රෙසිඩන්සීස්, රාජගිරිය
ලියාපදිංචි දිනය : 2016.12.06

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

01-309

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සේකෝදෝ ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 112256
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 51, වෙන්දේසි වත්ත, වැලිසර, රාගම
ලියාපදිංචි දිනය : 2016.03.08

සමාගමේ නම : සිනෙන්සිස් සිලෝන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 112425
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 51, වෙන්දේසි වත්ත, වැලිසර, රාගම
ලියාපදිංචි දිනය : 2016.03.14

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

01-310

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සොලිඩ් සර්ෆ් හවුස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 117104
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 16, නීතිඥ කාර්යාල සංකීර්ණය, කොටුව, මාතර
ලියාපදිංචි දිනය : 2016.10.10

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

01-311

---

## ඇටර්නි බලය අවලංගු කිරීමේ දැන්වීමයි

වාද්දුව, වේරගම පාර, අංක 4/44 දරන ස්ථානයේ පදිංචි ඇමරිකාවේ වර්ජිනියා 23456 වර්ජිනියා බීච්, රිවර් ඕර්ක් වටරවුම අංක 3801 හි රැදී සිටියදී විදේශ ගමන් බලපත්‍ර අංක එන් 403250045 හිමි පාලමණ්ඩඩිගේ සුපෙම් තීක්ෂණ ප්‍රනාන්දු වන මා විසින් 2015.05.14 දිනැති ඇමරිකාවේ වර්ජිනියා නගරයේදී අත්සන් තබන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් මොරටුව, කටුබැද්ද, ජෝන් රුද්‍රිගු මාවත, අංක 125/17ඒ හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 627450125 වී හිමි පාලමණ්ඩඩිගේ මේරි බ්‍රිජට් ප්‍රනාන්දු යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද විදේශ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ඉවත් කරන ලද බවත්, මින් ඉදිරියට එකී ඇටර්නි බලපත්‍රයේ වලංගුභාවයක් නොමැති බැවින් එකී ඇටර්නි බලපත්‍රය මත පාලමණ්ඩඩිගේ මේරි බ්‍රිජට් ප්‍රනාන්දු විසින් කරනු ලබන මොනයම් හෝ කාර්යයක් කටයුත්තක් හෝ ක්‍රියාවක් ගනුදෙනුවක් සම්බන්ධයෙන් මාගේ කිසිදු වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

පාලමණ්ඩඩිගේ සුපෙම් තීක්ෂණ ප්‍රනාන්දු.

01-334

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි**

ලියාපදිංචි අංක පී වී 118682 දරන කොළඹ 05, ෆයිප් පාරේ, අංක 03 දරන ස්ථානයේ ලියාපදිංචි ලිපිනය සහිත ඒවියේෂන් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2016 දෙසැම්බර් මස 14 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂක.

01-377

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : සී එන් සී වුඩ්වර්ක් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 110690
ලියාපදිංචි ලිපිනය : අංක 215/23 ඒ, කොළඹ පාර, දිවුලපිටිය, බොරලැස්ගමුව.

සමාගම් ලේකම්.

01-431

**දැන්වීමයි**

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කේ. එම්. ගවුන්ඩර් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118806
ලියාපදිංචි දිනය : 2016.12.20
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

01-432

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## නිවැරදි කිරීමේ දැන්වීමයි

සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව

2016 දෙසැම්බර් මස 30 වැනි දින පළවූ අංක 2000 දරන රජයේ *ගැසට් පත්‍රයේ* 1 වැනි කොටස 11 (ආ) වැනි ඡේදයේ වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් යටතේ පළවූ ගැසට් නිවේදනයේ සඳහන් 1 වන වෙන්දේසියේ 3 වන උපලේඛනය යටතේ පළ වූ ලොට් අංක 17 ලකුණු කළ ඉඩමේ ප්‍රමාණය පර්චස් දෙළහක් (අ. 0 රූ. 0 පර්. 12) ලෙස සඳහන් විය යුතුය.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011-3068185, 011-2572940.

01-401

## ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 7038/7603/7802 දරන උකස්කරයන් යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද ප්‍රාදේශීය සභා සීමාවට අයත්, පට්ටිය දකුණේ පිහිටි, උකස්කරයට අනුව අංක 12 සහ බලයලත් මිනින්දෝරු එන්. කුලරත්න විසින් සාදන ලද 1993 සැප්තැම්බර් 19 වන දිනැති අංක 1639 දරන පිඹුරේ ලොට් අංක 02 ට අනුව අංක 10, ශ්‍රී මේධානන්ද පාර යන ලිපිනය දරන ''දෙල්ගහවත්ත'',

''එරමුදුගහවත්ත'', ''ඇටපැළකුඹුරේවත්ත'' සහ ''ඇටපැළකුඹුර'' ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය: අක්: 00 රූඩ්: 00 පර් 15 (පර්චස් පහළොවයි) එහි පිහිටි නිවස, පස. ගස්වැල්, වගාවෙන් සහ සියල්ල සහිතව පානදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්තිරුව F 591/226 යටතේ ලියාපදිංචි කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. පී. ආර්. රණසිංහ විසින් සහතික කරන ලද 2009 අප්‍රේල් මස 08 වැනි දිනැති අංක 7038. 2010 ජූලි මස 22 වන දිනැති අංක 7603 සහ 2010 ඔක්තෝබර් මස 01 වැනි දිනැති අංක 7802 දරන උකස්කරයන් ප්‍රකාර. අංක 12 මේධානන්ද පාර, පානදුර යන ලිපිනයේ පදිංචි ධනුෂියා මේරිඇන් පර්නැන්ඩස් විසින්.

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ට උකස් කරන ලදුව, ගෙවීම් වලදී පොරොන්දු නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ, ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 ජනවාරි මස 31 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිගෙන් 25% ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50% (සියයට පනහක්),
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු.500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු.

ගැනුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

මෙම වෙන්දේසියේ දී, උපරිම ලන්සුව බැංකුවේ අපේක්ෂිත අගයට වඩා අඩුවන අවස්ථාවක, වෙන්දේසිය අහෝසි කිරීමටත් දේපළ නැවත වෙන්දේසි කිරීමේ හෝ විකිණීමේ හෝ වෙනත් ඕනෑම තීරණයක් ගැනීමේ අයිතිය බැංකුව සතුවේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් හි නීති දෙපාර්තමේන්තුව අමතන්න: දුරකථන අංක 011-4648000.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-390

---

## සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපල දඹුල්ල පදිංචි දෙලේවත්ත අප්පුහාමිලාගේ ධම්මික යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*1 වන වෙන්දේසිය :*

**පළමු උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කඩපල්ලේ කෝරළේ, බෙලිගමුව කොස්පොත පිහිටි ගලමැදේයාය හෙවත් දුම්කොළහේන හෙවත් කොරගහගොල්ල හෙවත් කටුපිල යාය දැන් වහුගේ කනත්ත යනුවෙන් හඳුන්වන ලබන බෙද වෙන් කරන ලද ඉඩම අක්කර හයක් (අ.6 රූ.0 පර්.0) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පෙර කී ඉඩම් කොටස වඩාත් මෑතක මැනීමකදී පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර කඩපල්ලේ කෝරළේ, බෙලිගමුව කොස්පොත පිහිටි බලයලත් මිනින්දෝරු කේ.එම්.ඩී.බී.සී. නාරම්පනාව විසින් සාදන ලද 2014 ජනවාරි මස 02 වැනි දිනැති අංක 353 සැලැස්මේ නිරූපණය වන වහුගේලන්දේයාය හෙවත් ගලමැද්දේයාය, දුම්කොළහේන හෙවත් කොරගහගොල්ල හෙවත් කටුපිල යාය දැන් වහුගේ කනත්ත යනුවෙන් හඳුන්වන ලබන ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස අක්කර පහයි රූඩ් තුනයි පර්චස් විසිහතක් විශාල (අ.5, රූ.3, පර්.27) ක් විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 ජනවාරි මස 31 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - ගලේවෙල නගර මධ්‍යයේ සිට කුරුණෑගල පාර ඔස්සේ මැල්සිරිපුර දෙසට කි. මී. 2 ක පමණ දුරක් ගිය විට පිහිටි දඹුගහමුල, මොරගොල්ල හංදිය දක්වා පැමිණ දකුණු පසට ඇති මොරගොල්ල පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 2 ක පමණ දුරක් ගිය විට මාර්ගයේ වම්පසින් අදළ දේපළ පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය.* -

**දෙවැනි උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ලේකම් කොට්ඨාසය තුළ වගපනහ පල්ලේසිය පත්තුවේ දඹුල්ල ගමේ පාදෙනිය පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 1998.06.10 වැනි දිනැති අංක 550 සැලැස්මේ නිරූපණය වන කුඹුරු වෙලේ යාය හෙවත් කුඹුරේවෙලේ යාය යනුවෙන් දන්නා සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහහතරයි දශම පහක් විශාල (අ. 0, රූ. 0, පර්. 14.5)ක් විශාල ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

පෙර කී ඉඩම් කොටස වඩාත් මෑතක මැනීමක දී පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වගපනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල ගමේ පාදෙනිය පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 2011.09.02 වැනි දිනැති අංක 5398 සැලැස්මේ නිරූපණය වන (බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් සාදන ලද 2004.03.13 වැනි දිනැති අංක 2380 ඒ සැලැස්මේ නිරූපණය වන ලොට් ඒ හි නැවත මැනීමක් වන) කුඹුරු වෙලේ යාය හෙවත් කුඹුරේවෙලේ යාය යනුවෙන් දන්නා සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් කේ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහයක් විශාල (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 ජනවාරි මස 31 වැනි දින පෙරවරු 11.45 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - දඹුල්ල ඔරලෝසු කණුව මංසන්ධියේ සිට මාතලේ පාර ඔස්සේ කි. මී. 0.9 ක පමණ දුරක් ගොස් ආර්ථික මධ්‍යස්ථානය ද පසු කළ විට පිහිටි 73/2 දරන බෝක්කුවට පෙර වරිපනම් අංක 344 දරන දඹුල්ල ටිම්බර් මිල්ස්, ස්මාර්ට් ඔයිල් මාර්ට්, සහ සාවින්ද බුක් ෂොප් සහ කොමියුනිකේෂන් යන අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

*3 වන වෙන්දේසිය*

**තුන්වැනි උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පහලවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දැන් දඹුල්ල, දඹුල්ල මහ නගර සභා සීමාව තුළ මාතලේ උතුර වගපනහ පල්ලේ සිය පත්තුවේ පහලවැව පාදෙනිය පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. තංගරන්දෙනිය විසින් සාදන ලද 2012.05.07 වැනි දිනැති අංක 7954ඒ සැලැස්මේ නිරූපණය වන කුඹුරුවෙලේයාය සහ කාලවෙලේයාය (කොටසක්) යනුවෙන් දන්නා සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 1 සහ 2 ලකුණු කළ එක දේපළක් සේ සැකසුණු යාබද බෙද වෙන්කරන ලද ලොට් 1 සහ 2 හි මුළු එකතුව අක්කර එකයි, පර්චස් හතරයි, දශම බිංදුවයි පහක් විශාල (අ. 1, රූ. 0, පර්. 4.05) ක් විශාල සම්බන්ධ සියලු මාර්ග ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ලොට් 1 සහ 2 ලකුණු කළ ඉඩම් කොටස් පහත සඳහන් ඉඩම්වල එකතු කළ සහ නැවත මනින ලද කොටසකි.

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පහලවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ දැන් දඹුල්ල මාතලේ උතුර වගපනහ පල්ලේ සිය පත්තුවේ පහලවැව පාදෙනිය පිහිටි කුඹුරුවෙලේයාය සහ කාලවෙලේයාය (කොටසක්) යනුවෙන් දන්නා සහ හඳුන්වනු ලබන බෙද වෙන්කරන ද ඉඩම් කොටස පර්චස් හතලිහක් විශාල (අ. 0, රූ. 0, පර්. 40) ක් විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

එකී ඉඩම් කොටස් දැන් නැවත මැන පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පහලවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ දැන් දඹුල්ල මාතලේ උතුර වගපනහ පල්ලේ සිය පත්තුවේ, පහලවැව පාදෙනිය පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරන්දෙනිය විසින් සාදන ලද 2012.05.07 දිනැති අංක 7954 ඒ සැලැස්මේ නිරූපණය වන කුඹුරුවෙලේයාය සහ කාලවෙලේයාය (කොටසක්) යනුවෙන් දන්නා සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙද වෙන්කරන ද ඉඩම් කොටස පර්චස් හතලිහක් විශාල (අ. 0, රූ. 0, පර්. 40) ක් විශාල සම්බන්ධ සියලු මාර්ග, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

2. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, පහලවැව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ දන් දඹුල්ල මාතලේ උතුර වගපනහ පල්ලේ සිය පත්තුවේ පහලවැව පාදෙනිය පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. එස්. සංගරන්දෙනිය විසින් සාදන ලද 2012.05.07 දිනැති අංක 7954 ඒ සැලැස්මේ නිරූපණය වන කුඹුරුවෙලේයාය සහ කාලවෙලේයාය (කොටසක්) යනුවෙන් දන්නා සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස රූඩ් තුනයි පර්චස් හතරයි දශම බිංදුවයි පහක් විශාල (අ. 0, රූ. 3, පර්. 4.05) ක් විශාල සියලු සම්බන්ධ මාර්ග, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2017 ජනවාරි මස 31 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - දඹුල්ල ඔරලෝසු කණුව මංසන්ධියේ සිට නුවර පාර ඔස්සේ මීටර් 50ක පමණ දුරක් ගොස් වම්පසට ඇති පහලවැව පාරට හැරී තවත් මිටර් 200 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් තෙන්නකෝන් මාවතට පෙර පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2016.11.25 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත් වල 2016.11.11 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2016.11.09 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03. දුරකතන අංක 011 - 2456478, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ /අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක : 011- 3068185, 011- 2572940.

01-282

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.